www.AlevelApi.com
සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

චිත්‍ර කලාව II சித்திரக்கலை II Art II	51 S II	පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours

උපදෙස්:

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදසියේ පසුපිටේ පැහැදිලි ව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකි ය.

ස්වාභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති පැලැටිය සහිත ද්‍රව්‍ය සමූහය ඇඳ වර්ණ කරන්න.

* කඩදසි තලය, අර්ථවත් ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
* ද්‍රව්‍යවල හා පැලැටියේ /අතුරිකිල්ලේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස්මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ ව සැලකිලිමත් වන්න.
* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන **ආකාරයට** ඇඳ **ඒ මත** ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන **වර්ණ කරන්න.**
* වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.
* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
* ද්‍රව්‍ය සමූහය තබා ඇති ලැල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට පිළිවන.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

***

www.alevelapi.com
උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

www.AlevelApi.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

චිත්‍ර කලාව III சித்திரக்கலை III Art III	51	S	III

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

- පහත සඳහන් **'අ'**, **'ආ'** සහ **'ඉ'** කොටස් තුනෙන් **එක** කොටසක් තෝරාගන්න. එම කොටසේ එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.
- ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදසියේ පසුපිටේ පැහැදිලි ව ලියන්න.
- චිත්‍රය භාර දෙන විට එය වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසි විය හැකි ය.
- ඕනෑ ම වර්ණ මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය. (දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිත ව හෝ භාවිත කිරීමට නිදහස ඇත.)
- ටිෂූ කඩදසි අවශ්‍ය අයට සපයනු ලැබේ.

'අ' කොටස - චිත්‍ර සංරචනය

❒ පහත සඳහන් මාතෘකාවලින් **එකක්** පමණක් තෝරාගන්න.

1. නිවසක් ආශ්‍රිත ව පැවැත්වෙන ආගමික කටයුත්තක බැතිබර අවස්ථාවක්
2. වනෝද්‍යානයක දිය නාන ඇත් රැළක් ඇසගැටුණු සංචාරක පිරිසක්
3. දේශාතුරාගය / ශ්‍රද්ධාව පිළිබිඹු වන භාවමය ප්‍රකාශනයක්

'ආ' කොටස - මෝස්තර නිර්මාණය

❒ පහත සඳහන් මාතෘකාවලින් **එකක්** පමණක් තෝරාගන්න.

4. සත්ත්ව හා මල් ලියකම් සහිත පාරම්පරික සැරසිලි මෝස්තර ඇසුරෙන් සෘජුකෝණාස්‍ර බුම්මුතුරුණක් (අඩි 10×10) නිර්මාණය කරන්න.
5. වියුක්ත සත්ත්ව හැඩතල ඇසුරෙන් බතික් ක්‍රමයට වර්ණ ගැන්වීම සඳහා සරමකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. දළද පෙරහැර තේමා කරගත් බිත්ති කැටයමකට සුදුසු සැරසිල්ලක් සැලසුම්කර වර්ණ කරන්න.

'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

❒ පහත සඳහන් මාතෘකාවලින් **එකක්** පමණක් තෝරාගන්න.

7. "අපි වවමු රට නගමු" යන තේමාව විග්‍රහ වන පරිදි ප්‍රචාරක පෝස්ටරයක් සමතල (OFF-SET) මුද්‍රණ ක්‍රමයෙන් මුද්‍රණය කිරීම සඳහා සැලසුම් කරන්න.
8. දේශීය ශාක සාර එක්කරමින් නිෂ්පාදිත සබන් කැටයක් ඇසිරීම සඳහා අහල් $3 \times 2 \times 1$ ප්‍රමාණයේ ඇසුරුම් පෙට්ටියක් සැලසුම් කරන්න. සුදුසු නමක් යොදන්න.
9. "දේශීය කලාකර්මාන්ත" මැයෙන් දේශීය කලා කර්මාන්ත විග්‍රහ කෙරෙන ග්‍රන්ථයක් සඳහා කන්චුක නිර්මාණයක් කරන්න.

***

Alevel Api උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

චිත්‍ර කලාව சித்திரக்கலை Art	I - II - III I - II - III I - II - III	51	S	I,II,III

විභාග ශාලාධිපතිවරුන්ට උපදෙස්
(මෙය විභාග ශාලාධිපතිවරුන් විසින් පමණක් පරිහරණය කළ යුතු ය.)

☐ චිත්‍ර කලාව I - ලියන පත්‍රය

* I පත්‍රය කොටස් දෙකකින් සමන්විත වන අතර එහි I වන කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 40 කින් යුතුවන බවත් II වන කොටස අනු කොටස් තුනකින් යුතු වන අතර ඉන් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සැපයිය යුතු බවත් අයදුම්කරුවන්ට දනුම් දෙන්න.

* I පත්‍රයට පිළිතුරු සැපයීමේ දී අදළ ස්ථානයෙහි සෑම අයදුම්කරුවකු ම තම **විභාග අංකය** සඳහන් කරන බවට සුපරීක්ෂාකාරී වන්න. මේ බව ඔවුනට දනුම් දෙන්න.

* වැඩ අවසානයේ දී I පත්‍රයේ කොටස් දෙකට ම අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු බව අයදුම්කරුවන්ට දනුම් දෙන්න.

☐ චිත්‍ර කලාව II - **ස්වභාවිකත්ව අධ්‍යයනය හා තිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය**

* එක් අයදුම්කරුවකුට එක් ඩ්‍රෝවින් කඩදාසියක් බැගින් ලබා දෙන්න. (මේ සඳහා විශේෂ ඩ්‍රෝවින් කඩදාසි සපයා ඇත.)

* රූප සටහනෙහි දක්වා ඇති ආකාරයට ද්‍රව්‍ය සමූහය සහිත මල් ඉක්ත සකස් කරන්න. ද්‍රව්‍ය සමූහය ඇස් මට්ටමෙන් පහළ ධාරකයක් මත තැබිය යුතු අතර, ද්‍රව්‍ය සමූහයේ ඉහළ සීමාව ඇස්මට්ටමේ පිහිටන සේ පිළියෙල විය යුතු ය.

* ලැල්ල සහිත ද්‍රව්‍ය ධාරකයක් වශයෙන් ශිෂ්‍යයින් පාවිච්චි කරන පැතලි ඩෙස්කුවක් ප්‍රයෝජනයට ගත හැකි ය.

* කිසිම ආකාරයකින් හෝ අයදුම්කරුවන්ට චිත්‍රය ඇඳිය යුතු ආකාරය හා වර්ණ කළයුතු ආකාරය පිළිබඳව උපදෙස් දීමෙන් වලකින්න.

යෝජිත ද්‍රව්‍ය :-

1. රෝල් කරන ලද කඩදාසියක් (A4 ප්‍රමාණයේ)
2. වීදුරු බෝල් එකක් (Glass Bowl)
3. පොඩි වට්ටක්කා ගෙඩියක්
4. පෙට්ටියක් (20 cm × 15 cm × 10 cm පමණ වූ පෙට්ටියක් - සුදු ඩිමයි කඩදාසියකින් ආවරණය කරන්න.)
5. රුක්අත්තන මල් ඉත්තක් - මල් දෙකක් පමණ ඇති (නැතහොත් රෝස හෝ වද මල් ඉත්තක්)
6. ප්ලාස්ටික් ජෝගුවක්
7. මල් සහිත විත්ත රෙදි කැබැල්ලක් (මීටර පමණ)

[දෙවෙනි පිටුව බලන්න.

Alevel Lapi උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

* ද්‍රව්‍ය සමූහය පිළියෙල කිරීම සඳහා **විශේෂඥ චිත්‍ර කලා ගුරුභවතකුගේ සහාය ලබාගැනීම** ඉතා වැදගත් ය.

* ආසන පිළියෙල කිරීම - ද්‍රව්‍ය සමූහයේ සිට මීටර 2.25ක් පමණ ඈතින් අර්ධ කවාකාර ව පිළියෙල කරන ලද ආසනවල අයදුම්කරුවන් වාඩි කරවන්න. ද්‍රව්‍ය සමූහයත් එක් එක් අයදුම්කරුවාත් අතර දුර මීටර 4.5 නොඉක්මවිය යුතු ය.

* මෙම පත්‍රයට පෙනී සිටින අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව විශාලවන අවස්ථාවලදී ඔවුන් කණ්ඩායම් වශයෙන් පිළියෙල කොට එක් එක් කණ්ඩායම සඳහා වෙන වෙන ම ද්‍රව්‍ය සමූහය බැගින් ඉදිරිපත් කිරීම අවශ්‍ය ය. එක් කණ්ඩායමකට අයදුම්කරුවන් **15** කට වඩා **නොවැඩි** විය යුතු ය. අයදුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව අනුව කණ්ඩායම් ගණන තීරණය කරන්න.

* මෙම පත්‍රයට පෙනී සිටින අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණ දයි ඊට දින කිහිපයකට පෙරාතුව දන ගැනීමෙන් මෙදිනට අදළ සංවිධාන කටයුතු පහසු කර ගත හැකි වනු ඇත.

* මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ආසන පිළියෙල කරන ආකාරය දක්වෙන සැලැස්මක් සෑම කණ්ඩායමක් සඳහා ම පිළියෙල කොට, උත්තර පත්‍ර සමග ඉදිරිපත් කළ යුතු බව සලකන්න. අයදුම්කරුවන්ගේ විභාග අංක එම සැලැස්මෙහි සඳහන් විය යුතු ය.

□ **චිත්‍ර කලාව III** - (අ) කොටස - චිත්‍ර සංරචනය
(ආ) කොටස - මෝස්තර නිර්මාණය
(ඉ) කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

එක් අයදුම්කරුවකුට එක් ඩ්‍රෝවින් කඩදාසියක් බැගින් බෙදා දෙන්න. මේ සඳහා විශේෂ ඩ්‍රෝවින් කඩදාසි සපයා ඇත. අවශ්‍ය අයට පමණක් ටිෂූ කඩදාසි සපයන්න.

● **සැලකිය යුතුයි :**

චිත්‍ර කලාව II සහ III ප්‍රශ්න පත්‍රවලට අදළ පිළිතුරු පත්‍ර පාර්සල් කිරීමට පෙර, ඒවායේ සායම් වියළී ඇද්දයි බැලීමට විශේෂයෙන් සැලකිලිමත් වන්න. සායම් වියළීමට පෙර, උත්තර පත්‍ර පාර්සල් කිරීම නිසා ඒවා එකිනෙකට ඇලීමට ඉඩ ඇත. මෙය අයදුම්කරුවන්ට අවාසිදායක විය හැකි ය. ඔබට භාර දෙනු ලබන චිත්‍ර වියළෙන්නට පෙර පාර්සල් කිරීමෙන් වළකින ලෙස විශේෂයෙන් අවධාරණය කරමි.

[තුන්වෙනි පිටුව බලන්න.

Alevel ලාපි උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.

සැ. යු. : ද්‍රව්‍ය සමූහය සැකසූ විට උඩින් දිස්විය යුතු අයුරු
குறிப்பு : ஒழுங்குபடுத்தப்பட்ட பொருள்களின் மேலிருந்தான தோற்றம்
N. B. : The aerial view of the objects when arranged in order.



ඉදිරිපස පෙනුම
முன்தோற்றம்
FRONT VIEW



www.alevelapi.com
Aeve Apis උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දේ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත.